# ශ්‍රී ප්‍රදීපාර්ථ

කසුනි නදීකා

මුද්‍රණය - 2017 ඔක්තෝබර්

# ගී ප්‍රදීපාර්ථ

© කසුනි නදීකා

ISMN- 979-0-9006500-0-9

පරිගණක අක්ෂර සංයෝජනය
නදීකා දයාංගනී

පිටකවර නිර්මාණය
චන්දන අරුණදේව

ඡායාරූප
නෙලුම් මුදලිගේ

ප්‍රකාශනය
කර්තෘ ප්‍රකාශනයකි

මුද්‍රණය

මාධවී පැතුම්
624, බුළුගහ හන්දිය
නුවර පාර , කැලණිය.

## ☆☆ සමර්පණය ☆☆

කවිය වී පද වැලක නොලියුවුණු
තනුව වී ගීතයක නොරැඳුණු
එළිය වී දිවිපුරා ගැවසුණු
මවක වී ළඟ රැඳී හිනැහුණු

මගේ ආදරණීය අම්මාට ..........

## .... පෙරවදන ....

කොළඹ විශ්ව විද්‍යාලයේ දෙවන වසරේ ශිෂ්‍යාවක වන කසුනි නදීකාගේ කුළුඳුල් කෘතිය ලෙස ' ගී ප්‍රදීපාර්ථ ' - 'ප්‍රදීපා ධර්මදාස ගී රත්නාවලී රස විනිස' එළි දකී. කසුනි සිංහල විෂය තම විශේෂ උපාධිය සඳහා හදාරමින් සිටින විද්‍යාර්ථිනියකි.

කසුනි නදීකාගේ මෙම ව්‍යායාමය මා අගය කරන්නේ හේතු දෙකක් මුල්කර ගනිමිනි. ඉන් පළමුවැන්න නම් මෙය කාව්‍ය ගීත රසාස්වාදය සඳහා පාසල් හෝ ශාස්ත්‍රාලීය මට්ටමින් පුළුල් ඉඩකඩක් හිමි නොවූ පරපුරක් බිහි ව ඇති යුගයක එළි දකින කෘතියක් වීමයි. අප පසු කරගෙන ආ 70 , 80 දශක මෙන් ම ඊට පෙර දශක එක හමාරක් පමණ ද පාසල් ක්ෂේත්‍රයේ මෙන් ම පළල් සමාජ තලයේ කවිය, ගීතය හා පොදුවේ සාහිත්‍යය පිළිබඳ සංවාද - විසංවාදයන්ට තෝතැන්නක් විය. ඉන් පසු අද දක්වා එය පළල් සමාජයේ පටු තීරුවක අතලොස්සක් අත රැඳුණු සුළුතරයකගේ මෙවලමක් බවට පත් වූයේ රාජ්‍ය කාරකාදීන් විසින් ම සාහිත්‍යය පාසල් විෂය මාලාවෙන් පිටමං කොට දැමීම නිසා ය. වර්තමානය වනවිට උසස් පෙළ කලා විෂය ධාරාවේ ද සිංහල විෂය හදාරන සිසුන් සංඛ්‍යාවේ අවරෝහණය අපට ලබා දෙන්නේ සුබ පණිවුඩයක් නො වේ. මෙබඳු අවාසනාවන්ත පසුබිමක කසුනි නදීකා ගීතය වැනි ඉසියුම් මාධ්‍යයක 'රස විනිස' වෙනුවෙන් කැපවීම ම සියලු සාහිත්‍ය ප්‍රේමීන් ට සතුටු විය හැකි කාරණයකි.

දෙවැන්න නම් ඇය තම රස විනිස සඳහා තෝරා ගත්තේ අපට සිටින විශිෂ්ටතම වේදිකා නාට්‍ය ශිල්පිනියක මෙන් ම විශිෂ්ටතම ගායන ශිල්පිනියක වූ ප්‍රදීපා නිර්මලී ධර්මදාස ශිල්පිනියගේ ගේය කාව්‍ය සමුච්චය වීමයි. සුභාවිත ගීතයෙන් සහෘද ජන බන්ධූන්ගේ රස මනස අවුළුවා - සනසවා සුපෝෂණ කළ විශිෂ්ට කලාකරුවන් පිළිබඳ ව රටට අමතක ව ගිය මොහොතක ප්‍රදීපා ධර්මදාස වැනි විශිෂ්ට ගායන ශිල්පිනියකගේ නිර්මාණ සම්පත පෙර ඇඳුරන් පැවසූ ලෙස 'බි බී තුටුවච් සවන් දෝතින් ' යැයි සහෘද සජ්ජන රසාස්වාදය උදෙසා පිළිගැන්වීම විශිෂ්ට සද්කාර්යයකි.

ප්‍රදීපා නිර්මලී ධර්මදාස යනු දේශයකට - ජාතියකට කලාතුරකින් බිහිවන විශේෂතා රැසක් ප්‍රකට කරන ගායන ශිල්පිනියකි. නර්තන වේදය , රංග වේදය මෙන් ම ගායන වේදය පුරා කෘත පුණ්‍ය මහිමයක් සේ උරුම කර ගත් ඇය මෙරට වේදිකාව තම උත්තම සම්ප්‍රදානයෙන් පොහොසත් කළා ය. වේදිකාව මත ප්‍රගුණ කළ මනා හඬ පාලනය , උච්චස්වර ගායනය , හැඟීම් ගායනය වැනි සම්පත් ඇය සිය ගායන මාධූර්ය පොහොසත් කර ගැනීම සඳහා යොදවා ගත්තා ය. එමෙන් ම ගායන ශිල්පයේ විශිෂ්ට ලක්ෂණයන් වූ ශ්‍රැති ඥාන , රාග ඥාන , තාල ඥාන, ලය ඥාන වැනි සුවිශේෂී ලාක්ෂණිකයන්ගෙන් තම ගායන ලීලය සුපෝෂණය කළා ය.

මේ සියල්ලට ම වඩා ඇගේ ගමන් මගෙහි විශේෂත්වය වන්නේ ගීතය යනු හුදු සෞන්දර්යවාදී ගුණය ම පරිවාර කොට ගත්තක් නො ව තමන් ජීවත් වන සමාජ ජීවිතයෙහි එක්තරා හරස් කඩක් නියෝජනය කරන්නක් බැව් හඳුනා ගෙන ඒ සඳහා උචිත වූ ගේය කාව්‍ය භාවිතය මගින් සාහිත්‍යයත් - සංගීතයත් අතර වූ මධුරතම සම්භෝගය වඩා අර්ථ සම්පන්න ක්ෂේත්‍රයක් වෙත යොමු කිරීමයි. ගී පද මාලාවක් තෝරා ගැනීම යනු ගායන ශිල්පියාගේ හෝ ශිල්පිනියගේ ආස්ථානය පැහැදිලි කෙරෙන එක්තරා මාර්ග දර්ශකයකි. ප්‍රදීපාවන්ගේ සමස්ත ගී සමුච්චය ඉතා සියුම් ලෙස විශ්ලේෂණය කිරීමේ දී ඇගේ හඬින් සිදුකෙරෙන සමාජ ආමන්ත්‍රණය කෙතරම් ප්‍රබල ද යන්න වටහා ගැනීම අපහසු නො වේ.

ඒ අනුව කසුනි නදීකා නම් තුරුණු විද්‍යාර්ථිනිය මේ පිවිස ඇත්තේ අයමින් - විතරින් පුළුල් වූ ජීවයෙන් පණ ගැහෙන , ජීවිතය ජීවත් කරවන විසල් නිම්නයකට බැව් අවිවාදිත ය. එම විසල් නිම්නය පුරා සැරි සරමින් එහි වැඩී පරිපාකයට පත් මියුරු ඵල එකිනෙක නෙළා සහෘද සජ්ජන දෝතට පිළිගන්වන්නට කසුනි නදීකාට ඉඩ දී ගීතයේ හෙට දවස පිළිබඳ ව අපේක්ෂා පෙරදැරිව සෙනේ සිතින් බලා සිටිමු.

-මහින්ද චන්ද්‍රසේකර-


“ මනුෂ්‍යත්වය කෙරෙහි ආදරය දක්වන්නාට සියලුම මිනිස්සු ආදරය කරති.”
-ඉමර්සන්-